01. ගිරිකුල මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය පාසල් සමුපාකාර සමිතිය හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල එකමුතුව 'තිස්ස සහල් මෝල්' ව්‍යාපාරයේ අයිතිකරු වන දහම් සේනාරත්න පරිත්‍යාග කරන සහල් භාවිතයෙන් සකස් කර දෙබා දෙන සහල් කැඳ වීදුරුවට පාසල් සිසුන් රුචිකත්වයක් දක්වයි.

1 ගිරිකුල මහා විද්‍යාලය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක්ද ?

1 ආහාර 2 අධ්‍යාපනය 3 සෞඛ්‍යය 4 ආරක්ෂාව

2 ඉහත සිද්ධියෙහි ඇතුලත් සහල් කැඳ සකස් කිරීමට භාවිතා කළ සහල් අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද ?

1 භූමිය 2 ශ්‍රමය 3 ප්‍රාග්ධනය 4 ව්‍යවසායකත්වය

3 භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් වන්නේ,

1 සීමාසහිත ලංකා සීනි (පෞද්.) සමාගම

2 ශ්‍රී ලංකා ගුවන් සංගමය

3 ශ්‍රී ලංකා මහ බැංකුව

02. (i) පහත සඳහන් ප්‍රකාශන **සත්‍යද අසත්‍යද** යන්න දක්වන්න.

(අ) මිනිස් අවශ්‍යතා සීමිත වන අතර මිනිස් වුවමනා සංකීර්ණ වේ. (................)

(ආ) නිෂ්පාදන ව්‍යාපාරයක ගොඩනැගිල්ල නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ. (..............)

(ii) පහත දැක්වෙන්නේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුදත් සිදු කරනු ලැබූ කාර්ය 2කි.

1 මාර්ගගත (Online) ක්‍රමයට ව්‍යාපාර අධ්‍යයනය විෂයට ආදාළ පාඩමකට සහභාගී වීම.

2 නැගණිය සමඟ ගිටාරය වාදනය කිරීම.

ඉහත එකිනෙක කාර්ය වලින් ගම්‍ය වන මිනිස් අවශ්‍යතාව සඳහන් කර එය සපුරා ගෙන ඇති ආකාරය ලියන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකෘතියේ වගුවක් භාවිතා කරන්න.)

| මිනිස් අවශ්‍යතාව | එය සපුරාගෙන ඇති ආකාරය |
|---|---|
| 1 | |
| 2 | |

(iv) 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ හිමිකරු විකුණුම් ඉහළ යන ඉල්ලුමට මුහුණ දීම සඳහා සිය ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින් බැංකු ණයක් අයදුම් කළ විට දැන ගැනීමට හැකිවූයේ රජය විසින් වාර්ෂික බැංකු ණය පොළී අනුපාතය 12% සිට 8% දක්වා අඩු කර ඇති බවයි.

(අ) ඉහත සිද්ධියෙහි ඇතුලත් වන 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න.